පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- ඉතිහාසය

සතිය- දෙසැ. - 4

ශ්‍රේණිය-12

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

**නිපුණතාව** : සාමූහික ව ක්‍රියා කිරීමෙන් ජයග්‍රහණය අත්පත් කරගත හැකි බව අවබෝධ කර කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 6.1 අමෙරිකා මහාද්වීපයේ යුරෝපා ශිෂ්ටාචාරය පැතිර ගිය ආකාරය පරීක්ෂා කරන්න.

6.2 අමෙරිකානු නිදහස් සටන ලෝක ඉතිහාසයේ වැදගත් වන ආකාරය විග්‍රහ කරයි.

1. අමෙරිකානු නිදහස් සටන ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාධක පැහැදිලි කොට එම සටනේ වැදගත්කම සැකෙවින් විමසන්න.

2. "අමෙරිකානු නිදහස් සටන අමෙරිකානු සම්බන්ධයෙන් පමණක් නොව යුරෝපය සම්බන්ධයෙන් ද දැඩි බලපෑමක් ඇති කළේය."

i. අමෙරිකානු නිදහස් සටනේ නායකයා නම් කරන්න.

ii. අමෙරිකානු නිදහස් සටනේ ප්‍රධාන පාඨය වූයේ කුමක් ද?

iii. අමෙරිකානු නිදහස් සටනට තුඩු දුන් ආර්ථික හා දේශපාලන සාධක සැකෙවින් දක්වන්න.

iv. ඇමරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත ප්‍රකාශය පරීක්ෂා කරන්න.

3. "අමෙරිකානු නිදහස් සටනට දේශපාලන හා ආර්ථික යන සාධක හේතු විය."

i. එංගලන්ත රජුගේ අනුග්‍රහය යටතේ 1497 දී නිව්ෆවුනඩ්ලන්තයට පැමිණි යාත්‍රිකයා නම් කරන්න.

ii. එංගලන්ත ජනයා උතුරු අමෙරිකාවට සංක්‍රමණය වීමට හේතු වූ කරුණු දෙකක් දක්වන්න.

iii. උතුරු අමෙරිකාවේ නැගෙනහිර වෙරළබඩ පිහිටුවන ලද ඉංග්‍රීසි ජනපද තුනක් නම් කරන්න.

iv. ඉංග්‍රීසි ආණඩුව විසින් උතුරු ඇමරිකාවේ අනුගමනය කරන ලද යටත් විජිත ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.